සමවැදුම

# මල් මල් හීනය

මල් මල් හීනය හීනය හීතල උදයේ
පැල්පත් මීදුම මැද රැඳිලා
නිල්වන් අහසේ පින් බර යුගයක
රන්වන් රන්වන් හිරු නැගිලා

සමනල කන්දේ කරුණා ඇල්ලෙන්
තුන් සිංහලයේ වැව් පිරිකා
මුණිඳුන් සරණේ ආසිරි වැස්සෙන්
සිතුවිලි කතරේ මල් පිපිලා

මහා සාගරයේ වේ රන් දිවයින
මී අඹ ගෙඩියකි අවාරයේ
ඒ අඹ ගෙඩියේ මී මැස්සන් අපි
නිබඳව හිනැහෙන දිවා රැයේ

දෙහස් පන්සිය වසරක් දුර සිට
සිල් ගුණ වැගිරේ නිරන්තරේ
මංගල සමයක තොරතුරු ලියැවේ
සිංහල වංශයෙ කතන්දරේ

**තනුව, සංගීතය සහ ගායනය:** ආචාර්ය විශාරද නන්දා මාලනී
**රචනය:** මහාචාර්ය සුනිල් ආරියරත්න




හෙළ ගී පුරාවතේ වෙනම ම අංශයක් වෙන් වෙන්නේ මව් බිමේ අගය, අභිමානය කිය පාමින් ලියැවුණ, සංගීතවත් ව ගැයුණ දේශාභිමානී ගී වෙනුවෙන්. අප හට අනන්‍ය වූ අපේ ජන ගී අතරේ ද දේශාභිමානයට වෙනම ම සැළකිල්ලක් යොමු වී ඇත්තේය. එයින් සනාථ වන්නේ අපේ ජන ජීවිතය සමඟ කැටි වුණ දේශාභිමානය ජන කවි, ජන ගී ලෙසින් ද එළිදැක් වී ඇති බවයි. මේ අතරට එක් වන ජන ගී වර්ගයක් වන්නේ හටන් කවියි. යුගයෙන් යුගයට නිරන්තර ආක්‍රමණ වලට ගොදුරු වුණ අපගේ මව් බිමේ විරුවනට තමන්ගේ නිදහස වෙනුවෙන් නිරන්තර අරගලයක යෙදෙන්නට සිදු විණ. විටෙක හටන් කිරීම රැකියාවක් බවට ම පත් විණ. පතල් කවි, පාරු කවි, බඹර කැපිල්ල, කරත්ත කවි වැනි ජීවන වෘත්තීන් අලෙලා ගැයුණ කවි අතරට හටන් කවි එක් නො වන්නේ මන්දැයි සිතෙනා තරමට ම හටන් කවි ගැමි ජනයා අතර ප්‍රචලිතව පැවතින.

දේශාභිමාන ගී පිළිබඳව සළකා බැලීමේදී හැත්තෑව - අසූව දශකවල ලියැවුණ පද රචනාවල රටාවෙන් ස්වයාක්තව ලියැවුණ පද රචනාවකි ''මල් මල් හීනය''. මින් වසර පනහකට පමණ පෙර ලියැවුණ අදටත් මිහිරෙන් විඳිය හැකි ගීයක් නිර්මාණය වීමට පදනම් වූ පද වැලකි මේ. දේශාභිමානී ගී රචනා කලාවට මුසුවුන ප්‍රෞඪත්වය, වීරත්වය වැනි ගුණාංග වලට වඩා සෞන්දර්යාත්මක බවින් සහ ඒ තුළින් ඉස්මතු වන දෑ හිතකාමී හැඟීම් වලින් අනූණ වන පදරචනාවකි මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ ''මල් මල් හීනය'' පද රචනාව.

පැල්පත් අතරේ රැඳුන මීදුම අතරේ රැඳුන මල් මල් හීනයක්. පින්බර යුගයක් වෙනුවෙන් පායන හිරු කිරණ රන්වන් පාටින් ඒ මීදුම සිසාරා. අනාගතය වෙනුවෙන් බලාපොරොත්තු ඇති කරවන සිහින හෙළිවෙන නව යුගයක උදාවයි, මේ.

සමනොල කන්දෙන් ගලා හැලෙන්නේ කරුණාවේ දිය ඇල්ලක්. ඒ ඇලිවලින් මුළු තුන් සිංහලයේ ම වැව් පිරී ගිහින්. සමනොල අඩවියෙන් ගලා හැලෙන මහවැලි නදිය වියලි කලාපයේ වැව් දියවර වඩන්නා සේ මේ ගලා, පිරී ඉතිරී යන්නේ කරුණාවයි. ශ්‍රී පාදය නමදින්නට කරුණා කරන්නන්ගේ කරුණාවෙන් මුසුවන කරුණාවයි. ශ්‍රී පාදය නමදින්නට කරුණා කරන්නන්ගෙන් මුසුවන කරුණාවයි, මේ මහාචාර්යවරයාණන් ඉතා ම සියුම් ලෙස මහවැලි නදියත්, එහි දියවරත් රූපක කොට ගෙන අපගේ සාරධර්ම, දැහැමි හඟුම් පිළිබඳව පද ගොතන්නේ අනියම් ලෙසකින්. මුණිදුන්ගේ ආසිරි වැසි නිසා පාළු වී ගිය සිතුවිලි වලට නව අදහස් මල් පිපිලා. වියලි බිම් තෙමාලන වර්ෂාවක් වැනිය, බුදු රජාණන් වහන්සේ දෙසූ දහමින් නැගෙන ආසිරි. බලාපොරොත්තුවලින් තොරව වියලී ගිය සිතුවිලි අතරට පිපෙනා මල් වාගෙයි නව නිර්මාණ.

මහා සාගරයෙන් වට වුණ අපගේ රන් දිවයින මී අඹ ගෙඩියක් සේ සාරවත් රසයෙන් අනූනයි. ඒ සාරවත් බවින් රසවත්ව පළ ලබනා මී මැස්සන් වෙමු අපි. රැයේ දවාලයේ සතුටින් සිටින්නට, හිනැහී සිටින්නට හැකි වටපිටාවකි මී අඹ ගෙඩියක හැඩැති මව් බිමේ පවතින්නේ.

මව් බිමේ දහම් සිසිලෙන් නැහැවෙන පුරාවත වසර දෙහසක් පන්සියයක් දක්වා අතීතයට දිව යයි. ඒ දහමෙහි සීලවන්ත ගුණ තවමත් නිරතුරුව වැගිරෙන බිමකි මේ. නැවුම් බලාපොරොත්තු ඇති කරවන මංගල සමයක තොරතුරු, සිංහල වංශ කතාවට එක් වෙන යුගයකි මේ.

හැත්තෑව දශකයේ ලක් බිමේ සිදු වූ අසිරිමත් ඉදිකිරීම් අතරින් මහවැලි ව්‍යාපාරය මුල් තැන ගනියි. මහවැලිය උතුරට හැරවීමේ සුබ මොහොත වෙනුවෙන් ගී ගණනාවක් ම නිර්මාණය විය. මේ ඒ අතරට එක් වූ තවත් වටිනා, අර්ථවත් ගීයක් ලෙසින් අපි අනුමාන කරන්නෙමු.

ගීතයට තනුව නිර්මාණය කරගෙන, සංගීත රටාවලින් හැඩ කොට ගායනා කරන්නේ ආචාර්ය විශාරද නන්දා මාලනී ප්‍රවීණ ගායනවේදිනියයි. අපේ හෙළ ගී පුරාවතේ තනු හා සංගීත නිර්මාණයට මුලින් ම අවතීර්ණ වන නන්දා මාලනී සංගීතවේදිනිය ''සාරි පොඩිත්තක්'' ගීත එකතුවේ ඇති ගීත 16 කත් තවත් ගීත කීපයකත් මේ හපන්කම පාන්නීය.

''මල් මල් හීනය'' පද පෙලේ වචනවලින් නැංවෙන රිද්මය ම මුල් කරගෙන ජන ගී නාද රටා හුරුවට තමන්ම නිර්මාණය කරගන්නා ස්වතන්ත්‍ර තනුවට සිතාරය, වයලීනය වැනි සංගීත මෙවලම් මුසු කරගන්නී, ඇය ''ඔබෝ'' වාද්‍ය භාණ්ඩය ද අපගේ හුරුවට වැයෙන්නට සළස්වා ගන්නී ය. හොරණෑවක හඬ ඊට වඩා මදක් සෞම්‍යව වැයෙන ඕබෝ භාණ්ඩය සංගීත රටා අතර වඩාත් ඉස්මතු වෙන සේ යොදා ගන්නට විශාරදවරිය උනන්දු වී ඇත්තේ අභියෝගාත්මකව යි. ඉතා පහසුවෙන් ග්‍රහණය කරගත හැකි තනුවට රිද්මය නංවන්නේ පර්කෂන් කට්ටලයෙන්.

නියම හෙළ කාන්තා හඬ පෞරුෂය මේ යැයි හෙළ ගී කෙතට හඳුන්වා දුන් ආචාර්ය විශාරද නන්දා මාලනියගේ පැහැදිළි කොමළ හඬ මේ දේශාභිමානී ගීතයට එක් කරන්නේ ප්‍රාණවත් බවක්. සෞන්දර්යාත්මක වචන පෙළක් තුළින් ඇය සිය හඬ මොනවට විහිදුවාලමින් ඊට දේශාභිමානය, ගෞරවාන්විත බව මෙන්ම සැදැහැති බව එකට මුසු කරවන්නේ පද රචනාවේ අන්තර්ගතයට මුලුමනින්ම අනුගතව.



සිසිර දිසානායක